#mediaethicsSL #TamilNews #EnglishNews #SinhalaPress #TVchannels #lka #HiruTv #TvDerana #Lankadeepa #Divaina #Mawbima #Ada #Dinamina #DailyNews #veerakesari #Thinakkural #Thinakaran

කොන්තන්තිවු ප්‍රදේශයේ පියෙකු විසින් සිය දරුවන්ව ඝාතනය කොට දිවියෙන් සමුගත් පුවත තෝරාගත් රූපවාහිනී සහ මුද්‍රිත මාධ්‍ය ඔස්සේ යම් ප්‍රමුඛතාවයකින් යුතුව, කැපී පෙනෙන අයුරින් සහ එසේ නොවන ලෙසින් වාර්තා කොට තිබූ ආකාරය පහත දත්ත සටහනින් දක්වා ඇත. මෙහිදී අපට දැකිය හැක්කේ ඇතැම් පුවත්පත් මෙය ඉහළ ප්‍රමුඛතාවයකින් යුතුව ප්‍රධාන සිරස්තල පුවත ලෙසින්ද, නැතිනම් මුල් පිටු පුවත් ලෙසින්ද පළ කොට තිබූ බවයි. එසේම ඇතැම් විද්‍යුත් නාලිකා මගින් හැඬුම් දෙඩුම් සහිත සංවේදී අවස්ථාවන් සමගින් මෙය වාර්තා කොට තිබිණි. මේ අතර ඇතැම් පුවත්පත් මෙම සිදුවීමට ප්‍රමුඛතාවයක් නොදී, ඇතුළු පිටු පුවත් ලෙසින් පළ කොට තිබූ බවද නිරීක්ෂණය කිරීමට හැකි විණි.

මෙම එකඳු පුවතක් සමගින් හෝ උපකාරක අංක සඳහන් කොට නොතිබීම සඳහන් කළ යුතු අතර, එය සිය දිවි අහිමි කරගත් පුවතක් වාර්තා කිරීමේදී අවශ්‍ය වන බව දක්වා සිටිමු. එසේම, මෙවැනි පුවතකට ප්‍රමුඛතාවය ලැබිය යුතු අන්දම සම්බන්ධයෙන් ඔබේ අදහසද විමසා සිටිමු.
-ලෝක සෞඛ්‍ය සංවිධානය මගින් සියදිවිනසා ගැනීම් වාර්තා කිරීම සම්බන්ධයෙන් හඳුන්වා දී ඇති මාර්ගෝපදේශන නිර්දේශයන් (2017 සංස්කරණය)
http://www.who.int/.../suicide-prev.../resource_booklet_2017/en/